මීනුවන්ගොඩ නගර සභාව
-----------------------------
ගම්පහ දිස්ත්‍රික්කය
--------------------

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දිනද විස්තරාත්මක විගණන කළමනාකරණ වාර්තාව 2019 අගෝස්තු 21 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මීනුවන්ගොඩ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
---------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2018 නොවැම්බර් 12 දින සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා කාල සීමාවට අදාල තැන්පත් ලේඛනයේ රඳවාගෙන තිබූ රු.307,167 ක් වූ ගලි බවුසර් ආදායම ගිණුම්ගත කර නොතිබුණි. | වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කළ යුතු වේ. | ජනල් අංක 02 යටතේ 2019 අවසන් ගිණුමින් නිවැරදි කිරීමට කටයුතු කර ඇති බව දන්වමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.217,500 ක් වූ ගෙවිය යුතු උපදේශන ගාස්තු, සමුච්චිත අරමුදල් ගිණුම හා ණයහිමි ගිණුමට ගැලපීම් කර තිබුණි. | වර්ෂයට අදාල ගනුදෙනු නිවැරදිව ගිණුම් ගත කළ යුතු වේ. | මෙම මුදල තවදුරටත් ගෙවිය යුතු බැවින් සමුච්චිත අරමුදලින් ගෙවීමට කටයුතු කර ඇති බව දන්වමි. |
| (iii) | 2017 දෙසැම්බර් 20 දින ගැසට් පත්‍රයක් මඟින් ඉඩම් අත්පත් කර ගැනීමේදී අත්හැරි ඇති ඉඩම් කොටස් නැවත එම අයිතිකරුවන් වෙත නිදහස් කිරීම සඳහා රු.2,711,520 ක් වූ සංවර්ධන වටිනාකම ආදායමට නොගෙන මිශ්‍ර තැන්පත් ලෙස ගිණුම් ගත කර තිබුණි. | ගනුදෙනුවලින් ජනිත ආදායම් නිවැරදිව හඳුනාගත යුතු වේ. | ජර්නල් සටහන් අංක 03 මගින් ආදායමට ගැනීමට කටයුතු කර ඇති බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (iv) | සමාලෝචිත වර්ෂයේ පුස්තකාලය ඉදිකිරීම සඳහා ආයෝජන උපලබ්ධිවීමෙන් ලැබූ මුදල රු.22,000,000 ක් ආයෝජන ලෙස දක්වා තිබුණි. | ගනුදෙනු නිවැරදිව ගිණුම් ගත කළ යුතු වේ. | 2019 මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී ලැබිය යුතු මුදලක් ලෙස දැක්වීමට කටයුතු කරන බව දන්වමි. |

(ආ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු. 89,400 ක් වූ විනෝද බදු ආදායම සන්නිරීක්ෂණය සඳහා ටිකට්පත් විස්තර ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. | මිශ්‍ර ආදායම් තොරතුරු යාවත්කාලීනව ඇතුලත් කරන ලෙස උපදෙස් ලබා දෙන ලදී. |

## 1.4 අනුකූල නොවීම

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 2016 ඔක්තෝබර් 10 දිනැති අංක LGD/09/01/15 බස්නාහිර පළාත් පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ලිපිය | පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුළ මස් විකිණීම විධිමත් කිරීම හා පාලනය කිරීම සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා සකස් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා ගත යුතු වේ. | අතුරු ව්‍යවස්ථා පැනවීමට අදාල මූලික කටයුතු සිදුකරමින් පවතින බව දන්වමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.18,370,592ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.35,316,728ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

2.2.1 සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. '000 | රු. ' 000 | රු. ' 000 | රු. ' 000 | රු. ' 000 | රු. ' 000 | රු. ' 000 | රු. '000 |
| (i) | වරිපනම් හා බදු | 10,287 | 11,659 | 10,550 | 7,058 | 10,525 | 10,652 | 10,833 | 5,949 |
| (ii) | කුලී | 20,398 | 21.356 | 21,006 | 1,297 | 21,640 | 19,426 | 19,599 | 946 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 620 | 491 | 491 | - | 532 | 1,137 | 576 | 05 |
| (iv) | වෙනත් ආදායම් | 29,281 | 16,101 | 16,101 | - | 17,261 | 31,361 | 28,444 | - |

### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **වරිපනම් හා බදු**<br>සමාලෝචිත වර්ෂය තුළදී රු. 170,453 ක වරිපනම් ආදායමක් ග්‍රාම නිලධාරි නිර්දේශයකින් තොරව කපා හැර තිබුණි. | ග්‍රාම නිලධාරි නිර්දේශය ලබා ගැනීම අත්‍යාවශ්‍ය වේ. | 2019 වර්ෂයේ සිට වරිපනම් ආදායම් කපා හැරීමේදී ග්‍රාම නිළධාරී නිර්දේශය ලබා ගැනීමට උපදෙස් ලබා දෙන ලදී. |

### 2.2.3 කුලී

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | නගර සභාව සතු මස් කඩයකින් 2014 සිට 2018 දෙසැම්බර් 31 දිනට පැවති රු.363,333 ක හිඟ මුදල අය කර ගැනිම සඳහා 2016 වර්ෂයේ නඩුවක් පවරා තිබුණි. | හිඟය අයකර ගැනීමට පියවර ගැනීම | 483/මුදල් අංක දරන නඩුවක් පවරා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වෙළඳ ස්ථාන 21 කට අදාලව රු. 463,900 ක හිඟ කුලී මුදල් 2019 මාර්තු 08 දින වන විටත් අය කර ගෙන නොතිබුණි. | හිඟය අයකර ගැනීමට පියවර ගැනීම | 2019 මාර්තු 31 දින වන විට කඩ කුලී හිඟයෙන් රු.247,350 ක මුදලක් අයකර ඇත. |

2.2.4 බලපත්‍ර ගාස්තු

---------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| හෝටල් සහ උත්සව ශාලා 04 කින් රු.56,400 ක් වූ පරිසර බලපත්‍ර ගාස්තු අයකර නොතිබුණි. | පරිසර බලපත්‍ර ගාස්තු අය කර ගැනීමට පියවර ගැනීම | උත්සව ශාලා දෙකකින් සඳහා පරිසර බලපත්‍ර නිකුත්කර තිබුණද ගාස්තු ගෙවා නොමැති අතර හෝටල් දෙකක් සඳහා පරිසර බලපත්‍ර ලබාදීමට පරීක්ෂා කරන ලෙස ප්‍රජා සංවර්ධන නිලධාරීතුමියට දැනුම් දී ඇත. |

2.2.5 වෙනත් ආදායම්

----------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | නගර මධ්‍යයේ ප්‍රදර්ශනය කර තිබූ ස්ථාවර දැන්වීම් පුවරුව සඳහා ගාස්තු අය කර නොතිබුණි. | බල ප්‍රදේශය තුළ සියළුම දැන්වීම් පුවරු සඳහා ගාස්තු අය කළ යුතුවේ. | ගාස්තු ගෙවීමකින් තොරව ප්‍රදර්ශනය කර ඇති ස්ථාවර දැන්වීම් පුවරු සඳහා ගාස්තු අය කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | සභා බල ප්‍රදේශය තුළ ස්ථාපිත කර තිබූ සන්නිවේදන කුළුණු 08 ක් සඳහා වරිපනම් තක්සේරු කර ආදායම් වැඩි කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සන්නිවේදන කුළුණු තක්සේරු කර වරිපනම් අය කිරීම කළ යුතුවේ. | වරිපනම් තක්සේරුවක් ලබාදී ආදායම් අය කර ගැනීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දී ඇති බව දන්වමි. |
| (ඇ) | නගර සභා බල ප්‍රදේශයේ පිහිටි සුපිරි වෙළඳ සැල් ,හෝටල් හා ලැඟුම්හල් තුළ පවත්වාගෙන යනු ලබන ඖෂධ වෙළඳාම සහ රට බීම විකිණීම යන වෙනත් ආදායම් ප්‍රභවයන් සම්බන්ධයෙන් රීති පනවා ගාස්තු අය කිරීමට කටයුතු කර නොතිබුණි. | රීති පනවා ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | එම ආදායම් ප්‍රභවයන් වෙනුවෙන් 2019 වසර සඳහා වෙන් වෙන් වශයෙන් බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම,ජනතාවගේ සුබ විහරණය පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 වර්ෂයේ ක්‍රියාවට නංවා තිබූ කර්මාන්ත අංශයේ සඳහන් ව්‍යාපාති 10 ක් වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට ඇතුලත් කර තිබූ අතර වර්ෂාවසාන කර්මාන්ත ප්‍රගතියෙහි දක්වා තිබූ එහෙත් වාර්ෂික සැලැස්මේ සඳහන් කර නොතිබූ වටිනාකම රු.10,607,843 ක් වූ කර්මාන්ත 16 ක් ක්‍රියාවට නංවා තිබුණු බැවින් ක්‍රියාකාරි සැලැස්ම පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට අනුව ක්‍රියාකාරකම් ඉටු කිරීම | 2018 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අයවැය ලේඛනයට ඇතුලත් කළද අවශ්‍යතාවය මත 2017 වසරේදීම එම ව්‍යාපෘති අවසන් කරන ලද අතර විගණනයෙන් පෙන්වා ඇති අනෙක් කර්මාන්ත 16 නව සභාව පත්වීමෙන් පසු ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති වේ. |

#### (ආ) අපේක්ෂිත ප්‍රතිලාභ (outcome) ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| හදිරම හන්දියේ වැසිකිළි පද්ධතිය රු. 5,388,055 ක් වැය කර 2018 ජනවාරි 04 වන දින ඉදිකිරීම් නිමකර තිබූ නමුත් 2019 මාර්තු 08 දින වන විටත් මෙය භාවිතයට ගෙන නොතිබුණි. | අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීම. | 2018 ජනවාරි 04 දින කොන්ත්‍රාත්කරු විසින් සභාවට භාර දී තිබුණද මැතිවරණය හේතුවෙන් මෙම වැසිකිළිය විවෘත කිරීම තාවකාලිකව පමා කරන ලදී. පත්වූ නව සභාව වැසිකිළි පද්ධතියද ඇතුලත් වන සේ නවීන සාප්පු සංකීර්ණයක් ඉදිකිරීමට යෝජනාවූ අතර එහි මූලික කටයුතු ආරම්භ කර ඇත. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසාර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රයට අනුව ඉලක්ක කරා ලඟාවීම සඳහා නියාමනය කරන ක්‍රමවේදයක් හඳුනාගෙන ඇති බව ප්‍රකාශ කර තිබුණද මේ සඳහා මෙහෙයවනු ලබන සෑම ව්‍යාපෘතියක්ම සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු හා ප්‍රගති සමාලෝචනයක් පවත්වා දුර්වලතා හා ශක්තීන් හඳුනාගෙන සුදුසු සංශෝධනයන් සිදු කර නොතිබූ හෙයින් දිළිඳුකම පිටුදැකීමේ ස්වයං රැකියා වැඩ සටහනක්වූ දිළිඳු සහන පොළ අසාර්ථකවී තිබුණි. | මෙහෙයවනු ලබන සෑම ව්‍යාපෘතියක්ම සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු සිදු කර පවත්නා දුර්වලතා හා ශක්තීන් හඳුනාගෙන අපේක්ෂිත ඉලක්ක ලඟා කර ගැනීම. | දිළිඳු සහන පොළ පැවැත්වූයේ සතිපොළ පවත්වන ස්ථානයට ආසන්නයේම වූ බැවින් ඔවුන්ගේ වෙළඳාම් අඩු වීම මත එම වෙළඳුන් තාවකාලිකව තම වෙළඳාම් කටයුතු සතිපොළ භූමියෙන් පිටත පවත්වාගෙන යනු ලබයි. |

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) සභාව සතු රූඩ් 01 පර්චස් 35.36 විශාල ඉඩම සහිත නිවස 1988 සිට මේ දක්වා වර්ෂ 31 ක් එකම අයකු විසින් භුක්ති විඳිමින් සිටින අතර 2007 වර්ෂයේ සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා වූ හිඟ කුලියවූ රු.972,000 ක් ද අයවී නොතිබුණි. කුලීකරුවන් නිවසින් ඉවත් කර සන්තකය ලබාගැනීමට අදාල බලධාරීන් කටයුතු නොකිරීම හේතුවෙන් නඩු කටයුත්තකට යාමට සිදුව ඇති අතර 2016 සිට 2018 යන වර්ෂවලදී පමණක් රු.127,500 ක් නීතිඥ ගාස්තු ලෙස ගෙවීම් කර තිබුණි. | සභාව සතු දේපලවලින් වාර්ෂිකව බදු අය කර ගැනිම හා දේපලවල අයිතිය හා පැවැත්ම තහවුරු කර ගැනිම. | කුලී නිවසට අදාල ගිවිසුම අවලංගු කර සන්තකය ආපසු භාරදෙන ලෙස සභාවේ නීතීඥ මහතා විසින් දන්වා යවා ඇති අතර නැවත වරක් ඉඩමේ ප්‍රමාණය තහවුරු කර ගැනීමට කටයුතු කරන අතර මාර්ග සංවර්ධනයේදී මහා මාර්ග පුළුල් වීම මත ඉඩමේ ප්‍රමාණය වෙනස් වී ඇත. |
| (ආ) මිනුවන්ගොඩ නගර සංවර්ධනය යටතේ බස්නැවතුම්පළ, නව මාර්ගය හා සතිපොළ ඉදිකිරීමට සැලසුම් කර පෞද්ගලික ඉඩම් හිමියන් සතු බිම් කට්ටි 34 ක් ප්‍රාදේශීය ලේකම් විසින් | ඉඩම් පවරා ගැනීමේදී ඉඩම් මිණුම් කර ලබා ගැනීමට කටයුතු කළ යුතු අතර අදාල ඉඩම් හිමියන්ට වන්දි | ඉඩම් පවරා ගැනීමේදි සැලැස්මට අනුව පමණක් භාර ගෙන ඇති අතර සින්නක්කරව ලබාගත් සමහර ඉඩම් කොටස් සඳහා වෙනත් අයගෙන් පවරා ගත් ඉඩම් කොටස් ලබාදී ඇත. |

| | | | |
|---|---|---|---|
| | රජයට පවරා ගෙන නගර සභාව වෙත පවරාදී තිබුණි. පවරා ගැනීමේදී ඉඩම් කට්ටි 03 ක් ගැසට් කිරීමට මග හැරී තිබුණු අතර, එහි එක් අයිතිකරුවෙකුගේ ඉල්ලීම පරිදි සංවර්ධනය කරන ලද ඉඩම් කට්ටියක් ආපසු භාරදීමට සිදුවී තිබුණි. නගර සභාව විසින් අදාල ඉඩම් මිනුම් කර ලබා ගෙන නොතිබු අතර, වසර 17 ක් ගතවී තිබුණද ස්ථිර ස්ථාන ලබාදෙන තෙක් විකල්ප ස්ථාන ලබාදී තිබූ ඉඩම් හිමියන් 08 දෙනෙකු සඳහා 2018 ඔක්තෝබර් 05 දිනටත් ස්ථිර ස්ථාන ලබාදී නොතිබුණි. තවත් ඉඩම් හිමියන් 08 දෙනෙකු විසින් වන්දි සම්බන්ධයෙන් නඩු පවරා තිබියදී එකී ඉඩම්වලින් එක් ඉඩම් හිමියෙකුට අදාල බිම් කොටසක් සඳහා නඩු කටයුත්ත නොසලකා සභාව විසින් ස්ථිරව ඔප්පු ලබාදී තිබුණි. | ගෙවීමට හෝ වෙනත් ඉඩම් ලබාදීමට කටයුතු කළ යුතුවේ. | ඉඩම් ලබාදීම සම්බන්ධයෙන් සභාවට විරුද්ධව නඩු පවරා තිබියදී නීතිමය තත්වය නොසලකා ඉඩම් කොටස් ලබාදී තිබුණි. |
| (ඇ) | ජුම්මා මස්ජිඩ් පාරේ නගර සභාව සතු ඉඩමට යාබද ඉඩමේ අයිතිකරු විසින් සභාවට අයත් පර්චස් 3.3 ක අනවසර ඉදිකිරීම් කර තිබූ අතර එම බිම් කොටස ආපසු ලබා ගැනීමට කටයුතු නොකොට 2016 වර්ෂයේ රු.303,419 ක් වැයකර මායිම් තාප්පයක් ඉදිකර තිබුණි. | සභාව සතු දේපලවල අයිතිය හා පැවැත්ම තහවුරු කර ගැනිම | වැය කර ඇති මුදල් එම වරද කළ අයගෙන් පරීක්ෂණයක් කර ලබා ගැනීමටත් සභාවට අහිමි වී ඇති ඉඩම් කොටස නැවත ලබා ගැනීමටත් හා මායිම් තාප්පය කඩා ඉවත් කිරීමටත් සභා සම්මත වී ඇති බව දන්වමි. |
| (ඈ) | 2001 ජනවාරි 04 දිනැති අංක 1165/19 ගැසට් පත්‍රය ප්‍රකාරව මු.පි. ගම්/3072 හා 2000 සැප්තැම්බර් 28 දිනැති පිඹුරේ කැබලි අංක 16 ලෙස නම් කර ඇති ඉඩම මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් නගර සභාවට පවරා තිබුණි.මෙම ඉඩම් කැබැල්ලට පෞද්ගලික හිමිකරුවකු අයිතිවාසිකම් කියන බැවින් ඉඩමේ නිරවුල් භුක්තියට බාධා ඇතිවී තිබුණි. | සභාව සතු ඉඩම්වල අයිතිය හා පැවැත්ම තහවුරු කර ගැනීම | අදාල ගැසට් පත්‍ර මඟින් සභාවට ඉඩම් පවරා ගෙන භුක්තිය භාර ගෙන එම ඉඩම් කොටස සංවර්ධන කර තිබුණි.එම කාලය තුළ ඉඩම පැවරු පුද්ගලයා විසින් වෙනත් පුද්ගලයකුට විකුණා ඇති බවත් ඔහු විසින් සංවර්ධන කටයුතුවලට බාධාවන අයුරින් කටයුතු කර ඇති බවටත් සභාව විසින් ඔහුට විරුද්ධව නඩු පවරා ඇති බවත් දන්වමි. |

3.3 නිශ්කාර්ය වියදම්

-----------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | --------------------- | ----------- | ------------------------------------ |
| (අ) | සති පොලක් ඉදි කිරීම සඳහා 2011 වර්ෂයේදී දේශීය ණය හා සංවර්ධන අරමුදලින් රු.මිලියන 05 ක ණය මුදලක් ලබාගෙන තිබුණු අතර රු.7,807,501 ක් වැයකර ගොඩනැගිලි 03 ක් ඉදි කර තිබුණි. මීනුවන්ගොඩ නගරයේ නව වෙළඳ සංකීර්ණයක් ඉදිකිරීම සඳහා 2018 වර්ෂයේ එම ගොඩනැගිලි කඩා ඉවත් කර නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියට ලබා දීමට සභාව විසින් කටයුතු කර තිබුණි. නිසි සැලසුමකින් යුතුව කටයුතු නොකිරීම හේතුවෙන් ඉහත දරන ලද වියදම අනාර්ථික වියදමක්වී තිබුණි. තවද දේශීය ණය සංවර්ධන අරමුදලින් 2011 වර්ෂයේ ලබාගෙන තිබූ මෙම ණය මුදල සඳහා 2021 වර්ෂය වන විට පොළිය සමඟ රු.1,971,606 ක් තවදුරටත් ගෙවීමට සිදුව තිබුණි. | ප්‍රාග්ධන වියදම් නිසි සැලසුමක් අනුව සිදු කිරීම | ඉදිකිරීමට යෝජිත නව වෙළඳ සංකීර්ණය මෙම ස්ථානයේ ස්ථාපිත කිරීම නාගරික සංවර්ධන අධිකාරිය මඟින් ආරම්භ කර ඇති අතර එහි පළමු අදියර 2018 වර්ෂයේ ප්‍රතිපාදන මත අවසන් කළ යුතුව ඇත.යෝජිත භූමියේ සභාව විසින් දේශීය ණය සංවර්ධන අරමුදලින් ලබාගත් රුපියල් මිලියන 07 ක ණය මුදල යටතේ ඇති ගොඩනැගිලි අතරින් විවෘත ගොඩනැගිල්ල පමණක් ඉවත් කිරීමට සිදුවේ. මෙම ගොඩනැගිල්ල ගලවා වෙනත් ස්ථානයක සවි කිරීමේ හැකියාව පවතින බැවින් මෙම නගර සභාවට අත්‍යාවශ්‍යව පවතින වාහන අංගනය සකස් කිරීමට මෙම ගොඩනැගිල්ලේ කොටස් යොදාගෙන ඇත.එබැවින් මෙම වියදම අනාර්ථික වියදමක් වී නොමැත. |
| (ආ) | ඩී.එස්. සේනානායක පිළිරුව මීනුවන්ගොඩ පරාක්‍රම පිට්ටනිය තුළ ස්ථාපිත කිරීමට සැලසුම් ඇස්තමේන්තු ලබා ගැනීමට සහ උපදේශන සේවා ලබා ගැනීම වෙනුවෙන් 2018 සැප්තැම්බර් 30 වන විට රු. 52,500 ක් වැයකර තිබුණි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම නිසා මේ සඳහා වැය කරන ලද රු.52,500 ක මුදල අනාර්ථික වියදමක් වී තිබුණි. | ප්‍රාග්ධන වියදම් නිසි සැලසුමක් අනුව සිදු කිරීම | මෙම පිළිරුව ස්ථාපනය කර ඇති ඇලිස්පාර්ක් පිටිය වෙනත් සංවර්ධන කටයුතු සඳහා යෝජනා වී ඇති හෙයින් දැනට ස්ථාපනය කර ඇති පැරණි පිළිමය ආරක්ෂිතව ගලවා ප්‍රවාහනය කර නව වේදිකාව මත ස්ථාපනය කිරීම ඇතුළු සමස්ථ ක්‍රියාවලිය සඳහා රු.52,500 ක් ගෙවීම් කර ඇත.මෙම ව්‍යාපෘතිය සඳහා ඇති වූ විරෝධතාවය මත ඉදිරි කටයුතු නවතා ඇත. |